**චක්‍ර ලේඛ අංක : 2 / 2005**

මගේ අංකය:- බප/සසේකො/ලේ/තිර
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.
අංක 50, තිඹුල්වත්ත පාර,
කොළඹ 08.
2005.01.18

සියළුම විවිධ සේවා සමූපකාර
සමිතිවල සභාපතිවරුන්,
ස.ණ.ස. සහ දිස්ත්‍රික්
බැංකු සංගම්වල සභාපතිවරුන්,

<u>සමූපකාර සමිති සහ සංගම්වල සේවයේ නිරත මුරකරුවන් සඳහා</u>
<u>වැඩ කරන කාලවේලාව, අතිකාල දීමනා හා නිවාඩු</u>

මුරකරුවන් සම්බන්ධයෙන් අනුගමනය කළයුතු රාජකාරි කාලසීමාව, අතිකාල දීමනා හා නිවාඩු පිළිබඳව සමහර සමිති විසින් නොයෙක්වර විමසීම් කරනු ලබන බව පෙනී යයි ඇත. එම කරුණු සලකා බලා කොමිෂන් සභාව විසින් පහත සඳහන් නියමයන් අනුව කටයුතු කළයුතු බවට සමිතිවලට උපදෙස් නිකුත් කිරීමට තීරණය කර ඇත.

(1) කොමිෂන් සභාවේ 8/97 සහ 1997.12.03 දිනැති චක්‍රලේඛය මගින් උපදෙස් දී ඇති පරිදි මුරකරුවන්ගේ පැය 08 ක දෛනික රාජකාරියෙන් පසු සේවය කරන කාලසීමාව සඳහා අතිකාල දීමනා ගෙවීමට අදාල නියමයන් පරිදි කටයුතු කළ යුතුය. මුරකරුවන් ගේ සේවා මුර සැකසීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි සිදු කළ හැකි ය.

(2) මුරකරුවකුට සතියකට දින 1 1/2 ක නිවාඩුවක් හිමි විය යුතු අතර එම නිවාඩුව තුළදී වුවද ඔවුන්ගේ සේවය ලබා ගෙන දින 30 ක් ඇතුලත වෙනත් දිනවලදී එසේ සේවය කළ කාලසීමාවට සමාන කාලසීමාවක් නිවාඩු ලබා දීමට හෝ විකල්ප වශයෙන් එකී කාල සීමාවන් සඳහා සාමාන්‍ය ප්‍රමාණය අනුව අතිකාල දීමනා ගෙවීමට හෝ සමිතිවලට පුළුවන.

ජේ.ජේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාතේ සමූපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍ය තුමා ගේ සම්බන්ධීකරණ නිලධාරී

2. ප්‍රධාන ලේකම් (බ.ප.)

3. ලේකම් - සමූපකාර, පළාත් මාර්ග හා විදුලිබල අමාත්‍යාංශය (බ.ප.)